2024-08-28

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2024
## විද්‍යාව

නම - ..............................................................

| 6 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය - 02 |
|---|---|---|

පොදු උපදෙස්

I කොටසේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න

### I කොටස

01. පහත දී ඇති ජීවීන් අතුරින් සංචරණය කල හැකි ජීවියා වන්නේ


1


2


3


4

02. ස්කන්ධය මැනීමේ සම්මත ඒකකය වන්නේ
1. ග්‍රෑම් 2. මිලිග්‍රෑම් 3. කිලෝ ග්‍රෑම් 4. මෙට්‍රික් ටොන්

03. පහත දක්වා ඇති චුම්බක වර්ගය වන්නේ
1. වලයාකාර චුම්බක 2. බුරුල චුම්බක
3. U හැඩති චුම්බක 4. පෙති චුම්බක



04. පදාර්ථයේ ලක්ෂණ පිළිබඳ බැලීමට සිසුන් කණ්ඩායමක් සිදුකළ ක්‍රියාකාරකමක රූප සටහනක් පහත දැක්වේ. මෙම ක්‍රියාකාරමෙන් ලබාගත් නිගමනය වන්නේ,
1. වාතය අවකාශයේ ඉඩක් ගන්නා බවය.
2. ජලය අවකාශයේ ඉඩක් ගන්නා බව ය.
3. වාතය අංශු වලින් සෑදී ඇති බවය.
4. ජලය අංශු වලින් සෑදී ඇති බව ය.



05. ජීවීන් ශ්වසනයේ දී කාබන්ඩයොක්සයිඩ් වායුව පිටකරන බව පෙන්වීම සඳහා සිදුකරන ලද ක්‍රියාකාරකමක රූපයක් මෙහි දැක්වේ. මෙහිදී ලැබෙන නිරීක්ෂණයක් වන්නේ,
1. හුණු දියර කිරි පැහැවේ
2. හුණු දියර වල වර්ණය වෙනස් නොවේ
3. හුණු දියර රෝස පැහැ වේ
4. නිවැරදි පිළිතුරක් ලබා දී නොමැත



06. තමන්ගේ ආහාර තමා විසින්ම නිපදවා ගන්නා ජීවීන් හඳුන්වන්නේ කවර නමකින් ද ?
1. විෂමපෝෂීන් 2. මාංශෝප ජීවීන් 3. පරපෝෂීන් 4. ස්වයංපෝෂීන්

07. පෘථිවිය මත ජලය පවතින ආකාරය පෙන්වීම සඳහා සිදුකළ ක්‍රියාකාරකමක රූපයක් මෙහි දක්වා ඇත. මෙහි **A, B, C** මගින්පිළිවෙලින් නිරූපණය වන්නේ ?
1. මතුපිට ජලය, භූගත ජලය, වර්ෂණය
2. වර්ෂණය, මතුපිට ජලය, භූගත ජලය
3. මතුපිට ජලය, වර්ෂණය, භූගත ජලය
4.වර්ෂණය, භූගත ජලය, මතුපිට ජලය



08. පදාර්ථයක් හා ශක්තියක් නිවැරදි අනුපිළිවෙලින් දක්වා ඇත්තේ කවර පිළිතුරේ ද ?
1. ආලෝකය, තාපය
2. වාතය, ජලය
3. ජලය, තාපය
4.ශබ්දය වාතය

09. එකම ආකාරයට ශබ්දය නිපදවන සංගීත භාණ්ඩ යුගලයක් වන්නේ මින් කවරක් ද ?
1. තබ්ලාව, රබාන
2. තබ්ලාව, ගිටාරය
3. සිතාරය, සර්පිනාව
4. වයලීනය, බටනලාව

10. මෙම රූපයෙන් දක්වා ඇති ක්‍රියාකාරකම මගින් ලබාගත හැකි නිගමනයක් වන්නේ,

1. ආලෝකය සරල රේඛීයව ගමන් ගන්නා බව.
2. පෙනීම සඳහා ආලෝකය අවශ්‍ය බව.
3. කාඩ්බෝඩ් කැබැල්ල පාරාන්ධ බව.
4. පෙනීම සඳහා ඇස අවශ්‍ය බව.

11. ලෝකයේ විවිධ රටවල විදුලිය නිපදවීම සඳහා භාවිතා කරන නමුත් ශ්‍රී ලංකාවේ විදුලි බලය නිපදවීම සඳහා තවමත් භාවිතා නොකරන ශක්ති ප්‍රභවය වන්නේ.
1. සුළඟ
2. භූ තාපය
3. සූර්යයා
4. ෆොසිල ඉන්ධන

12. ලවණතාවය යන සාධකය පදනම් කරගෙන ජලය වර්ගීකරණය කිරීමේදී ලවණතාවය අවරෝහණය නිවැරදි අනුපිළිවෙල වන්නේ.
1.කරදිය, කිවුල්දිය, මිරිදිය
2. කිවුල්දිය, කරදිය, මිරිදිය
3. කරදිය, මිරිදිය, කිවුල්දිය
4. මිරිදිය, කරදිය, කිවුල්දිය

13. ශක්ති ප්‍රභවයක් ලෙස භාවිතා වන "උදම් රළ" පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ.
1. චන්ද්‍රයාගේ හා සූර්යයාගේ බලපෑම නිසා උදම් රළ ඇතිවේ.
2. වඩදිය හා බාදිය ලෙස උදම් රළ ආකාර දෙකක් දැකිය හැකිය
3. ඇතැම් රටවල උදම් රළ විදුලිය නිපදවීම සඳහා භාවිතා කරයි.
4. ඉහත සියලුම ප්‍රකාශ සත්‍ය වේ.

14. රිද්මයානුකූල හඬක් සඳහා උදාහරණයක් නොවන්නේ.
1. ගීතයක් වාදනය කිරීම
2. වයලීන වාදනය
3. මෝටර් රථවල හඬ
4. බෙරහඬ

15. ජලජ පරිසරය ආරක්ෂා කිරීම සඳහා ඔබ විසින් කළ යුතු ක්‍රියාකාරකමක් වන්නේ කවරක්ද ?
1. නිවසේ ඉවත් කරන අපද්‍රව්‍ය ඇළ මාර්ග වලට දැමීම
2. නිවසේ වැසිකිළි වලින් පිටකරන අපද්‍රව්‍ය කලපුවට හැරවීම
3. භාවිතා කරන ලද කෘෂි රසායනික බෝතල් වැවට දැමීම
4. භාවිතයෙන් ඉවත් කරන අපද්‍රව්‍ය ජලාශ වලට එක් කිරීමෙන් වැළකීම

16. අනාගත ලෝකයේ ශක්තිය නිපදවීම සඳහා භාවිතා කළ හැකි පරිසර හිතකාමී ශක්ති ප්‍රභවය වන්නේ,
1. ගල් අඟුරු
2. සූර්යයා
3. දැව
4. පෙට්‍රෝලියම් තෙල්

17. දණ්ඩ චුම්බක යුගල දෙකක් එකිනෙකට ආසන්නව තබා ඇති අවස්ථා දෙකක් පහත දක්වා ඇත

A

B

මෙහිදී ලැබෙන නිරීක්ෂණ නිවැරදිව දක්වා ඇත්තේ පහත සඳහන් කවර පිළිතුරේ ද?

| | A | B |
|---|---|---|
| 1. | ආකර්ෂණය වේ | විකර්ෂණය වේ |
| 2. | විකර්ෂණය වේ | ආකර්ෂණය වේ |
| 3. | ආකර්ෂණය වේ | ආකර්ෂණය වේ |
| 4. | විකර්ෂණය වේ | විකර්ෂණය වේ |

04. විද්‍යා ප්‍රදර්ශනයක් සඳහා සකසන ලද ශබ්දය නිපදවන භාණ්ඩ කිහිපයක රූප පහත දක්වා ඇත.




(I) ධ්වනිය නිපදවන භාණ්ඩ හඳුන්වන නම කුමක්ද? (1)

(II) ඉහත උපකරණ වල ධ්වනිය නිපදවීම සිදුවන කොටස වෙන වෙනම ලියන්න

(a). A - (1)

(b). B - (1)

(c). C - (1)

(III) සංගීත නාද හා ඝෝෂා අතර වෙනස කෙටියෙන් ලියන්න (2)

(IV) ඝෝෂාකාරී ශබ්ද සඳහා උදාහරණ දෙකක් ලියන්න. (2)

(V) ශබ්දය සඳහා සංවේදී මිනිස් අවයවය (ඉන්ද්‍රියය) කුමක්ද ? (1)

(VI) එම ඉන්ද්‍රියට හානි විය හැකි අවස්ථාවක් ලියන්න. (1)

(VII) එම හානිය වළක්වා ගැනීමට ගත හැකි පියවරක් ලියන්න. (1)

(මුළු ලකුණු11)

05. පහත දැක්වෙන වගන්ති නිවැරදි නම් (√ ) ලකුණ ද වැරදි නම් (X ) ලකුණ ද ඉදිරියෙන් යොදන්න.

(I) නව ජීවීන් බිහිවීමේ ක්‍රියාවලිය ප්‍රජනනය ලෙස හඳුන්වයි. ( )

(II) පෘථිවි පෘෂ්ඨයෙන් 90%කටත් වඩා ජලයෙන් වැසී ඇත. ( )

(III) කාර්යය කිරීමේ හැකියාව ශක්තිය යයි. ( )

(IV) භූමිතෙල් යනු ද්‍රව අවස්ථාවේ පවතින පදාර්ථයකි. ( )

(V) සියලුම ශක්ති ප්‍රභව දිනෙන් දින ක්ෂය වී යමින් පවතී. ( )

(VI) චන්ද්‍රිකා ගමන් කරවීමට අවශ්‍ය ශක්තිය ලබාගන්නේ සූර්ය කෝෂ මගිනි. ( )

(VII) ශාකයක වර්ධනය සීමා රහිතය. ( )

(VIII) සබන් දියකල ජලය පාරභාසක වේ. ( )

(IX) ද්‍රව්‍යයක් ස්පර්ශ කල විට දැනෙන ස්වභාවය වයනය යි. ( )

(X) ශබ්ද තරංග කන වෙතට යොමු කිරීමට කන් පෙති උපකාරී වේ. ( )

(XI) න්‍යෂ්ටික විදුලි බලාගාරයක් නොරොච්චෝලේ පිහිටා ඇත. ( )

(මුළු ලකුණු11)

06.

(A) 6 ශ්‍රේණියේ සිසුන් පිරිසක් පාසල් වත්තේ සිදුකරන ලද ක්ෂේත්‍ර චාරිකාවක නිරීක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත. ඒවා ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ගසක මුල හැකරැල්ලෙක් වකුටු වී සිටීම.
2. නිදිකුම්බා ශාක පත්‍ර හැකිලීම.
3. දළඹුවෙකු ශාක පත්‍ර ආහාරයට ගැනීම.
4. ගඩොලක් කුඩා කැබලි වලට කැඩී තිබීම.
5. කඩා වැටුණු ශාක අත්තක කොළ හැලී තිබීම.

(I) මෙහිදී නිරීක්ෂණය කළ සත්ත්ව ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (2)

(II) ශාක දක්වන චලනයක් නම් කරන්න. (1)

18. ඝන අවස්ථාවේ පවතින ජලය සඳහා උදාහරණයක් නොවන්නේ,
1. හිම 2. ග්ලැසියර 3. භූමාලය 4. අයිස්

19. ආලෝකයේ ප්‍රයෝජනයක් නොවන්නේ.
1. ශාක තුළ ආහාර නිපදවීම 2. ධ්වනිය නිපදවීමට
3. සන්නිවේදන කටයුතු සඳහා 4. විනෝදාස්වාදය සඳහා

20. විද්‍යාව ඉගෙන ගන්නා දරුවෙකු ලෙස ඔබ විසින් කළ යුතු නිවැරදි කාර්යයක් වන්නේ.
1. පරිසරය ආරක්ෂා කිරීම.
2. විද්‍යාව විෂයට අදාළව පරිසර හිතකාමී විවිධ නිර්මාණ කිරීම.
3. ශක්තිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම.
4. ඉහත සඳහන් සියලුම කාර්යයන් සිදුකිරීම.

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න

01.

(A) එදිනෙදා ජීවිතයේ විවිධ කාර්යයන් සිදුකර ගැනීම සඳහා අපට ශක්තිය අවශ්‍ය වේ. එලෙස ශක්තිය ලබාගත හැකි දෑ ශක්ති ප්‍රභව ලෙස හඳුන්වයි.පහත රූපය හොඳින් නිරීක්ෂණය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



(I) පෘථිවියට ශක්තිය ලැබෙන ප්‍රධානතම ශක්ති ප්‍රභවය කුමක්ද ? (1)
(II) එම ශක්ති ප්‍රභවයෙන් අපට ලැබෙන ප්‍රධාන ශක්ති ආකාර දෙකක් ලියන්න (2)
(III) ඉහත (II) හි ශක්ති ආකාර 2 හි ගත හැකි ප්‍රයෝජනයක් බැගින් ලියන්න (2)
(IV) මෙම රූපයේ දැක්වෙන වෙනත් ශක්ති ප්‍රභවයක් නම් කරන්න (1)
(V) ශ්‍රී ලංකාව තුල විදුලිය නිපදවීම සඳහා භාවිතා කල හැකි ඉහත රූපයේ දැක්වෙන නිර්මාණය කුමක්ද ? (1)
(VI) ශ්‍රී ලංකාව තුල මෙවැනි විදුලි බලාගාර පිහිටා ඇති ස්ථාන දෙකක් ලියන්න (2)

(B) නිවසේ ශක්තිය නිපදවා ගැනීමට ජෛව ස්කන්ධ භාවිතා කරයි.
(I) ජෛව ස්කන්ධ යනු මොනවාද ? (2)
(II) ජෛව ස්කන්ධ සඳහා උදාහරණ දෙකක් ලියන්න (2)
(III) ජෛව ස්කන්ධ ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවක් පහත දැක්වේ.




(a). මෙම උපකරණය කුමක්ද ? (1)
(b). මෙහි X හා Y නම් කරන්න (1)
(c). මෙම උපකරණය සඳහා යොදාගත හැකි ජෛව ස්කන්ධයක් ලියන්න (1)

(මුළු ලකුණු16)

2024.08.24 G.6 Science

**02.** 6 ශ්‍රේණියේ සිසුන් සිදුකළ ක්‍රියාකාරකමක් පහත දැක්වේ. මෙහිදී ඉටිපන්දම හා කාඩ්බෝඩ් කැබැල්ල අතර පහත සඳහන් එක් එක් ද්‍රව්‍ය තබා පසුව ඉටිපන්දම් දැල්ල සිදුර තුළින් නිරීක්ෂණය කරන ලදී.

A - තුනී වීදුරු තහඩුව

B - තෙල් කඩදාසිය

C - ලෝහ තහඩුව



මෙහිදී ලැබෙන නිරීක්ෂණ අනුව පහත වගුවේ අදාළ ස්ථානයේ නිවැරදි අකුර (A, B, C) යොදන්න

| | නිරීක්ෂණය | ද්‍රව්‍යය |
|---|---|---|
| (I) | දැල්ල හා ආලෝකය හොඳින් පෙනේ | |
| (II) | ආලෝකය පමණක් පෙනේ | |
| (III) | කිසිවක් නොපෙනේ | |

(3)

(IV) මෙම ක්‍රියාකාරකමෙන් ලබාගත් නිරීක්ෂණ අනුව ඉහත ද්‍රව්‍ය තුන හැඳින්වීමට වඩාත් සුදුසු පද (පාරදෘශ්‍ය, පාරභාසක, පාරාන්ධ ) එම අක්ෂර ඉදිරියෙන් ලියන්න

(a). A -

(b). B -

(c). C - (3)

(V) මෙම ක්‍රියාකාරකමේදී භාවිතා කළ දීප්ත වස්තුවක් නම් කරන්න (1)

(VI) චන්ද්‍රයා දීප්ත වස්තුවක් නොවන්නේ ඇයි ? (2)

(VII) ආලෝක කදම්බයක් නිරූපනය කිරීමට රූප සටහනක් අඳින්න (2)

Learning Resource Center
R
De Mazenod College
Kandana

(මුලු ලකුණු11)

**03.** හිස්තැනට ගැලපෙන පිළිතුර තෝරා ලියන්න

(සංයුක්ත අණ්වීක්ෂය, මිනුම් සරාව, ඔක්සිජන් වායුව, ධ්‍රැව, ප්‍රත්‍යස්ථ ගුණය, උතුරු - දකුණු, තන්‍යතාව විද්‍යුතය, දෙදරීමක්, ජල දූෂණය, බහිස්‍රාවී )

(I) ශාක ප්‍රභාසංශ්ලේෂණයේදී ................................ පිටකරයි.

(II) ................................ පියවි ඇසින් නොපෙනෙන දේ නිරීක්ෂණය කිරීමට යොදාගනී.

(III) ඇදීමකට ලක්කළ විට නොකැඩී නොබිඳී කම්බි බවට පත්කළ හැකිවීම ................................ලෙස හඳුන්වයි.

(IV) ජීවීන්ට ................................ මාධ්‍යයක් ලෙස ජලය වැදගත් වේ.

(V) ජීවීන්ට භාවිතා කළ නොහැකි තරමට ජලය අපිරිසිදු වීම................................ නම්වේ.

(VI) චුම්බකයක බලය වැඩිපුරම ඇත්තේ එහි ................................ වලය.

(VII) ද්‍රව්‍යක පරිමාව මැනීම සඳහා ................................ භාවිතා කරයි.

(VIII) චුම්බකයක් නිදහසේ එල්ලා තැබූ විට එය ................................ දිශා ඔස්සේ නිශ්චල වේ.

(IX) බයිසිකල් සීනුවක් නාදවන අවස්ථාවේ ................................ සිදුවන බව දැනේ.

(X) ................................ ශක්තිය සඳහා උදාහරණයකි.

(XI) ළදරු සුප්පු සෑදීමට රබර් යොදාගන්නේ රබර් වල ................................නිසාය.

(මුලු ලකුණු11)

(III) ශාක භක්ෂක සතෙකු නම් කරන්න.

(IV) අජීවී ද්‍රව්‍යයක් සඳහන් කරන්න. (1)

(V) පදාර්ථයේ ඝන අවස්ථාව සඳහා මෙහි සඳහන් ද්‍රව්‍යයක් නම් කරන්න (1)

(1)

(B) පහත දක්වා ඇති දෙබෙදුම් සූචිය සළකන්න එහි **A, B, C, D, E** යන අක්ෂර වලට ගැලපෙන පිළිතුරු ලියන්න.

කපුටා, බල්ලා, කුකුළා, ගැඩවිලා, නයා

(A) ..................................

කපුටා, බල්ලා, කුකුළා

පාද 4 ක් ඇති

බල්ලා

(C) ..........................

කපුටා, කුකුළා

කරමලක් ඇති

කුකුළා

කරමලක් නැති

(E) ............................

පාද නැති

නයා, (B) ..................................

විෂ දළ ඇති

නයා

(D). ......................

ගැඩවිලා

1 x 5 = (05)

(මුළු ලකුණු11)

07. විද්‍යාගාරය තුළ ඔබ විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් කිහිපයකට අදාල රූප සටහන් පහත දක්වා ඇත.

(A) ඒවා ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

(I)



(a) මෙම ක්‍රියාකාරකමේදී එක් බැලූනයක සිදුකළ වෙනස කුමක් ද ? (1)

(b) ඔබට ලැබුනු නිරීක්ෂණයට අදාලව දළ රූපයක් ඇඳ පෙන්වන්න (1)

(II)



(a) පරීක්ෂණය සිදුකර ටික වේලාවකට පසු වීදුරුවේ පිටත පෘෂ්ඨයේ දුටු වෙනස කුමක් ද ? (1)

(b) එම නිරීක්ෂණයට අනුව අදාල නිගමනය කුමක් ද ? (1)

(III)



(a) රබාන වාදනය කරන විට එහි ඇති කඩදාසි කැබලි වලට කුමක් සිදුවේ ද ? (1)

(b) ඒ අනුව ධ්වනිය හටගන්නේ කෙසේද ? (2)

(B) පහත සඳහන් ද්‍රව්‍ය ලැයිස්තුවෙන් චුම්බකයකට ආකර්ෂණය වන ද්‍රව්‍ය හා ආකර්ෂණය නොවන ද්‍රව්‍ය වෙන්කර ලියන්න

අල්පෙනෙත්තක්, ඇලුමිනියම් කැබලි, යකඩ ඇණ, පිත්තල ඇණ, ලී කැබලි, ප්ලාස්ටික් කැබලි, ඉදිකටුවක්, රුපියල් දහයේ කාසියක්

| චුම්බකයට ආකර්ෂණය වන ද්‍රව්‍ය | චුම්බකයට ආකර්ෂණය නොවන ද්‍රව්‍ය |
|---|---|
| | |

(4)

(මුළු ලකුණු11)



REGISTRAR
De Mazenod College
Kandana.